1.a) Linux - පද්ධති මෘදුකාංග (System software)
Word processor – යෙදීම් මෘදුකාංග (Application Software)
Web Browser - යෙදීම් මෘදුකාංග (Application Software)

b) i) සැකසීමට (Process) බඳුන් නොවූ ඕම දත්ත, දත්ත (data) ලෙස හඳුන්වයි.
දත්ත සැකසීමෙන් අර්ථාන්විත තොරතුරු (information) ලැබේ.
වටුප් සැකසීමේ පද්ධති (Pay roll system)

දත්ත ——> සැකසීම ——> තොරතුරු

ii) නිරවද්‍ය බව අඩුවීම (inaccuracy)
කාර්යක්ෂම නොවීම (inefficiency)
දත්ත පිටපත්වීම (data duplication)
භෞතික වශයෙන් විශාල ඉඩක් අවශ්‍යවීම.

iii) පරිගණක හා ඊට සම්බන්ධ සියළු භෞතික කොටස් දෘඩාංග (hardware) වේ.
පරිගණකයට උපදෙස් ලබාදීමට යොදාගන්නා වැඩසටහන් මෘදුකාංග (software) වේ.
පරිගණකය පණ ගැන්වීම (bootup) සඳහා අවශ්‍ය වන වැඩසටහන් ස්ථිරාංග (hardware) ලෙස හැඳින්වේ.

c) තාක්ෂණය සඳහා ප්‍රවේශය තිබීම, සංවර්ධනය වෙමින් පවතින රටකට බොහෝ වාසි ගෙන දෙයි. රටක ආර්ථිකයේ උන්නතිය ඇති වීම ඉන් එකකට උදාහරණයකි. මීට අමතරව නිෂ්පාදන ක්‍රියාවලි වල පිරිවැය අවම කරවීම, නව වෙළෙඳ ව්‍යාපාර ඇති කිරීමට රුකුල් දීම සහ සන්නිවේදනය නව්‍යකරණය කිරීම වැනි දෑ මඟින්ද ආර්ථික වර්ධනයක් ඇති කිරීමට දායක වේ. තවද අධ්‍යාපනය හා මාධ්‍ය භාවිතය සඳහා එය යොදා ගනිමින් පුද්ගලයින්ගේ ජීවන තත්ත්වය උසස් කිරීමට ද හැකි වේ.

d) රැකියා වියුක්තභාවය:

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ ඇති අහිතකර බලපෑම් වලින් ඉදිරියෙන්ම ඇත්තේ රැකියා වියුක්ත භාවයයි. එමඟින් ආර්ථිකමය සහ සමාජයීය යන දෙඅංශයෙන්ම බලපෑම් ඇති වේ. එනම් ආදායම අහිමි වීම පමණක් නොව අයහපත් සමාජීය ගැටළු ද ඇතිවීමට තුඩු දේ. රැකියා අහිමිවීමට හේතු බොහොමයක් පවතී. හස්තීය කාර්යයන් (manual tasks) ස්වයංක්‍රීයකරණය (automate) වීම ප්‍රධාන හේතුවකි. උදාහරණයක් ලෙස නිෂ්පාදන පෙතක (production line) අතින් සිදු කෙරෙන කාර්යයන් රොබෝ යන්ත්‍ර මඟින් ප්‍රතිස්ථාපනය කරවීම දැක්විය හැකිය.

රැකියා අපනයනය:
ශ්‍රමයට ඇති අඩු වටිනාකම නිසා දත්ත සැකසීම වැනි කාර්යයන් වෙනත් රටවලට යැවීම තවත් උදාහරණයකි. තවද ශ්‍රමිකයින් වැඩි පිරිසක් සම්බන්ධ වී කරන කාර්යයන් ඊට වඩා අඩු පිරිසක් මඟින් ඉටුකර ගැනීම තවත් උදාහරණයකි. මෙහිදී එකම කාර්යයක් කරගැනීමට යොදවන ශ්‍රමය අඩුකර ගනී. උදාහරණයක් ලෙස අතින් වෙන වෙනම ඇතුළු නොකර තීරුක්ත කියවනයක් (barcode reader) යොදා ගනිමින් පරිගණකයට පහසුවෙන් ඇතුළු කර ගැනීමේ හැකියාව ලැබී ඇත.

පුද්ගල සම්බන්ධතා හීන වීම:
නිවසේ සිට රැකියාවේ නිරත වීමට ලැබීම තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ යහපත් ප්‍රතිඵලයක් ලෙස බොහෝ දෙනා පිළිගත්ත ද, එහි අහිතකර ප්‍රතිඵලද නැත්තේ නොවේ. දෛනික ජීවිතයේ දී බොහෝ දෙනාට අවශ්‍ය සමාජීය අන්තර් සම්බන්ධතා වල හීන වීමක් මෙමඟින් ඇති වේ. එහි ප්‍රතිඵලයක් ලෙස මිනිසුන් තනිව සිටීමින් අසතුටෙන් කාලය ගත කරන ආකාරය අප දැක ඇත.

ශාරීරික ක්‍රියාකාරීත්වය අඩුවීම :
පුද්ගලයින් අලස ජීවන රටාවකට හුරු පුරුදු වීම තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයෙන් ඇතිවන තවත් අයහපත් ප්‍රතිඵලයකි. අධික තරබාරුව, හෘද රෝග සහ දියවැඩියාව වැනි සෞඛ්‍ය ගැටළු පවා ඇතිවීමට මෙය හේතු වේ. RSI (Repetitive Strain Injury) සහ ඇසේ විඩාව (eye strain) වැනි සෞඛ්‍ය ගැටළු මඟහරවා ගැනීමට බොහෝ රටවල ආයතනික රෙගුලාසි පනවා තිබුනද, ශාරීරික ක්‍රියාකාරීත්වය මනාව තබා ගැනීමට විධිමත් වැඩසටහනක් නොමැති කම බලවත් පාඩුවකි.

2. a)
- වරලත් ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණ නියුක්තිකයෙකුට **(E-Waste Recycler)** ලබාදීම.
- කල් ඉකුත් වූ/ පැරණි පද්ධති අලෙවි කර දැමීම.
- පැරණි උපාංග, ඒවා සොයන්නන් වෙත බෙදා දීම.

පාසල්, විශ්වවිද්‍යාල හෝ වෙනත් ආයතන මඟින් නිසි ඊ-අපද්‍රව්‍ය කළමණාකරණ වැඩසටහන් මෙහෙයවන්නේ දැයි විපරමෙන් සිටීම. ඇතැම් අක්ෂි ආයතන මෙවැනි ව්‍යාපෘති දැනටමත් දියත් කර ඇති අතර නිශ්චිත දිනයක මහජන ඊ-අපද්‍රව්‍ය භාර ගැනීමට සූදානම්ව ඇති පරිදි වැඩසටහන් ධාවනය කරයි.

- ඉලෙක්ට්‍රොනික සමාගම්වලට ඒවා නැවත භාර දීම හෝ බැහැර කරන මධ්‍යස්ථාන වෙත ලබාදීම.
- පරිසරය ආරක්ෂා කර ගන්නා අතරම ඔබගේ සංවේදී දත්ත ඉවත් වීම පිළිබඳවද අවධානය දැක්වීම.

ඉලෙක්ට්‍රොනික උපක්‍රම/ උපාංග දෛනික ජීවිතයේ කොටසක් වී ඇති අතර, ඊ-අපද්‍රව්‍ය එහි අවාසි සහගත පැතිකඩ වේ. එබැවින් ඒවා බැහැර කිරීමට මත්තෙන් නිසි පරිදි ආකෘතිකරණය (format) කර තිබේදැයි බැලීම වැදගත් ය. මන්ද යත් පෞද්ගලිකත්වයට (privacy) ඉන් බලපෑම් ඇති විය හැකි බැවිනි.

b) වඩා නම්‍යශීලී ආකාරයකින් රාජකාරියේ නිරත වීමට ඉඩකඩ ලැබෙන නිසා නිවසේ සිට දුරුවන් බලා ගනිමින් රාජකාරි කටයුතු කළමනාකරණය කරගැනීමට අවස්ථාව ලැබේ. කාර්යාලයට යාමට අවශ්‍ය නොවන නිසා ඉන්ධන හා ගමනාගමන වියදම් ඉතිරි වේ. පරිසර හා වායු දූෂණය අවම වේ. තවද සේවා සපයන්නන්ගේ විදුලි බිල් හා කුලී වියදම් ද ඉන් අවම වේ.

c) රූපවාහිණිය, දුරකථනය හා අන්තර්ජාලය වැනි නූතන තොරතුරු තාක්ෂණික මෙවලම් සඳහා ප්‍රවේශය ඇති සහ එසේ නොමැති දෙපිරිස අතර වෙනස විස්තර කිරීමට ඩිජිටල් බෙදීම (digital divide) යන පදය යොදාගනී. එය නගරයේ හා දුෂ්කර ගම්මාන අතර පැහැදිලිව දක්නට ලැබේ.

d) ඩිජිටල් බෙදීම දුරලීමෙන් සමාජයීය හා සංස්කෘතිකමය වශයෙන් අසමානතාවයන්ට ලක් වූ දිළිඳු පුද්ගලයින්ගේ ජීවන තත්ත්වය උසස් කිරීමට හැකි වේ.

e) ගෝලීයකරණය හා නව ආර්ථිකය, උසස් ශිල්පීය දැනුම ඇති වඩාත් පුහුණු හා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය මඟින් සන්නද්ධ වූ ශ්‍රම බලකායක් නිර්මාණය කරමින් රටවල් අතර ඇති තරඟය තව තවත් වැඩි කරවයි. නව ආර්ථිකය මෙලෙස පොදු හා පෞද්ගලික ක්ෂේත්‍රවලට දැඩි බලපෑමක් ඇති කරන නිසා, තාක්ෂණය සඳහා ප්‍රවේශය තිබීම ශ්‍රී ලාංකිකයන්ට ඉතා වැදගත් වේ. මෙවැනි නිපුණ ශ්‍රම බලකායක් ඇති කර ගැනීම සඳහා රාජ්‍ය හා පෞද්ගලික යන දෙඅංශයේම දායකත්වය අවශ්‍ය වේ. එමඟින් තාක්ෂණය සඳහා ප්‍රවේශය සහ අවශ්‍ය තාක්ෂණික පුහුණුව ශ්‍රමිකයන්ට ලබාදිය හැකි වේ. පරිගණක හා අන්තර්ජාල පුහුණුව නොමැති පුද්ගලයන්ට උසස් වැටුප් සහිත රැකියාවන් සඳහා අයදුම්කිරීමට ඉඩ නොලැබේ. උසස් පුහුණුවකින් පසු සුදුසුකම් ලත් පුද්ගලයින් බවට පත් වේ. ශ්‍රී ලාංකිකයින් හට තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සාක්ෂරතාවය ලබා දීම අප සැමගේ වගකීම වේ.

(1) i. a. සාම්ප්‍රදායික සැකසුම් මෘදුකාංගවලින් නිර්මාණය කළ නොහැකි සංකීර්ණ හා විශාල ප්‍රමාණයේ දත්ත වේ.

b. දත්ත ආචයනය, විශ්ලේෂණය, ග්‍රහණය කර ගැනීම, සෙවීම, සන්නිවේදනය කිරීම, ප්‍රදර්ශනය කිරීම, පෞද්ගලිකත්වය රැක ගැනීම සංකීර්ණ ක්‍රියාවලියක් වීම

ii. www, FTP, Telnet, Email, Video Conferencing, Cloud Computing, IP TV, IP Telephone, remote Login

iii. දෘඩාංග, මෘදුකාංග, ස්ථීරාංග, ජීවාංග

iv. a. සෘජු ආදානය හා දූරස්ථ ආකාරය - පරිශීලකයාගේ මැදිහත් වීමකින් තොරව සෘජුව දත්ත ඇතුළත් කරයි. දූරස්ථ ප්‍රවේශයේ දී දත්ත ගබඩා කිරීම සඳහා නිර්මාණය කර ඇත. උදා: විවිධ භූගෝලීය ස්ථානවල දත්ත ගබඩා කිරීම සහ ගනුදෙනුවලදී භාවිතා වේ.

b. මාර්ගගත හා මාර්ගඅපගත ආකාරය - මාර්ගගත ආකාරයේ දී ගනුදෙනුව සිදු වන අවස්ථාවේදී ම දත්ත ආදානය සිදුවේ. මාර්ගඅපගත ආකාරයේ දී කාණ්ඩ වශයෙන් නිශ්චිත කාල පරිච්ඡේදයකට පසුව විවිධ අවස්ථාවල දී දත්ත ආදානය සිදු කෙරේ.

v. මෘදු පිටපත් ලබා දෙන උපාංග- උදා: පරිගණක තිරය දෘඩ පිටපත් ලබා දෙන උපාංග - උදා: මුද්‍රණ යන්ත්‍රය ශබ්ද උපාංග උදා:- ස්පීකරය

(2)

i. දත්ත වර්ගය පරීක්ෂාව - නිවැරදි දත්ත වර්ගය නිවැරදිව පවතීදැයි සොයා බලා පරිගණකගත කරයි.

උදා:- සංඛ්‍යා, දිනය, මුදල් ආදිය සඳහා නිවැරදිව දත්ත පැවතීම

ඇති බව පරීක්ෂාව - දත්ත පවතින බව පරීක්ෂා කර බලා වැදගත් දත්ත අනිවාර්යයෙන් ඇතුළත් කරයි. උදා: දත්ත ඇතුළත් කරන ක්ෂේත්‍රය හිස්ව පවතී ද යන්න සෙවීම

පරාස පරීක්ෂාව - දී ඇති පරාසය තුළ දත්ත තිබෙදැයි පරීක්ෂා කර බලයි.

උදා: හැඳුනුම්පත් අංකය, දුරකතන අංකය මුදල්, දිනය ඇතුළත් කිරීමේ දී

ii. අංක ගණිතමය හා තාර්කික ඒකකය - සියලුම වර්ගයේ අංක ගණිතමය හා තාර්කික ක්‍රියා සිදු කරයි.

පාලන ඒකකය - පරිගණක පද්ධතියේ සියලුම උපාංග පාලනය කරයි.

මතක රෙජිස්තර - මධ්‍ය සැකසුම් ඒකකය තුළ පිහිටා ඇති ඉතා වේගවත්ම මතකය වන අතර අංක ගණිතමය හා තාර්කික ඒකකය තුළ ක්‍රියාත්මක වෙමින් එයට අවශ්‍ය මතකය තාවකාලිකව රඳවා ගබා ගනී.

iii. කාණ්ඩ සැකසුම් ක්‍රමවේදය - කාණ්ඩ වශයෙන් දත්ත සැකසීම සිදු කරයි.

උදා:- ආයතනයක වැටුප් සැකසීමේ දී එක් එක් සේවකයාගේ දත්ත විවිධ අවස්ථාවල දී ඇතුළත් කර අඩු කිරීම් සහ එකතු කිරීම් සිදු කර මාසය අවසානයේ දී අවසන් වැටුප ගණනය කෙරේ.

තත්කාලීන සැකසුම - දත්ත ආදානය, ප්‍රතිදානය සැකසීම සහ ප්‍රතිදානය සමාන්තර ක්‍රියාවලියක් ලෙස සිදු කරයි.

උදා:- ඉවත් ටිකට්පත් වෙන් කිරීම, පරිගණකපාදක ස්වයංක්‍රීය නිෂ්පාදන ක්‍රියාවලි, ස්වයංක්‍රීය වාහන පද්ධති යෙදුම්

iv. මෙහෙයුම් පද්ධතිය, උපයෝගිතා මෘදුකාංග, භාෂා පරිවර්තක

v. විවෘත මූලාශ්‍ර මෘදුකාංග

මූලාශ්‍ර කේත ලබා ගත හැකිය. මෙවා භාවිතා කිරීම, වෙනස් කිරීම් හෝ බෙදා හැරීම් සඳහා අවසර ලබාගැනීමට අවශ්‍ය නැත. නොමිලයේ ලබා ගත හැක.

හිමිකම් සහිත මෘදුකාංග

මූලාශ්‍ර කේත ලබා ගත නොහැකිය. මෘදුකාංගයේ හිමිකරු විසින් මෙවා භාවිතා කිරීමට අවසර ලබා ගත යුතුය.

(3) i. රෝග විනිශ්චය පද්ධති, රෝගී අධීක්ෂණ පද්ධති, ඖෂධීය තොරතුරු පද්ධති, ශල්‍යකර්ම

ii. අනුහුරුකරණය, දුරස්ථ ඉගෙනුම හා ඉක්ත්‍රොනික ඉගෙනුම, වඩා හොඳඅන්තර්ගත ලබා දීම, ස්වයං ඉගෙනුම

iii. මාසික වේතන ගණනය කිරීම, අයවැය සැකසීම, විකුණුම් විශ්ලේෂණ, මූල්‍ය පුරෝකථන, ව්‍යාපාර කළමනාකරණය, දත්ත ගබඩා කළමනාකරණය, ව්‍යාපාර නඩත්තු කිරීම, අන්තර්ජාල බැංකු පහසුකම්, ස්වයංක්‍රිය ටෙලර් යන්ත්‍ර, මාර්ගගත බිල්පත් ගෙවීම්, මාර්ගගත වැටුප් ගෙවීම්

iv. <u>සිසුන්ට</u>

අන්තර්ජාල පහසුකම් පවතින විට ඕනෑම ස්ථානයක සිට ඕනෑම වේලාවක තම ඉගෙනුම් කටයුතු සිදු කළ හැකි වීම, පැවරුම් උඩුගත කර එසැණින් ප්‍රතිඵල ලබා ගැනීමේ හැකියාව, තමාට අවශ්‍ය පාඩම් නැවත නැවත අධ්‍යයනය කළ හැකි වීම, විද්‍යුත් පුස්තකාල පහසුකම්

<u>ගුරුවරුන්ට</u>

පැවරුම් උඩුගත කිරීමට හා මාර්ගගතව සිසුන් අධීක්ෂණය කිරීමට හැකි වීම

සිසුන්ගේ ලකුණු විශ්ලේෂණ සැකසීම හා ඉදිරිපත් කිරීමට පහසු ක්‍රමවේදය

ඉගැන්වීම් පහසුකාරක හා ඉගෙනුම් ආධාරකයක් වීම

v. විශාල භූමි සහිත ගොවිබිම්වල අස්වනු නෙලීම සඳහා රොබෝ යන්ත්‍ර භාවිතය, ස්වයංක්‍රිය වල්පැළ ඉවත් කරන හා කෘමි පාලනය, හරිතාගාර කළමනාකරණය, ශාකවල වර්ධන මට්ටම් අධීක්ෂණ හා වාර්තා ලබා ගැනීම, බෝග නිෂ්පාදනය සඳහා බලපාන කාළගුණික හා දේශගුණික විපර්යාස, වර්ෂාපතන දත්ත, පසෙහි සාරවත් බව, තෙතමනය ආදි තොරතුරු ස්වයංක්‍රීයව ලබා ගැනීම, සත්ත්ව ගොවිපළ කළමනාකරණය සඳහා තාක්ෂණය, වන්ද්‍රිකා තාක්ෂණය, පසු අස්වනු තාක්ෂණය, කෘෂිකාර්මික යන්ත්‍රසූත්‍ර, පොහොර සහ නව අස්වනු ප්‍රභේද පිළිබඳ පර්යේෂණ

(4) i. ✓ විවේක කාලය ඵලදායී ලෙස ගත කිරීම සඳහා තමාට රුචි අයුරින් විවිධාකාර තොරතුරු තාක්ෂණික යෙදවුම් භාවිතයට ඉඩ සලසා දීම (සමාජ ජාලා, විනෝද ක්‍රීඩා, ග්‍රාපික නිර්මාණ, ශ්‍රව්‍ය හා දෘෂ්‍ය නිර්මාණ ආදිය)

✓ තම කටයුතු පහසු කර ගැනීම සඳහා පරිගණක හා මෘදුකාංග යෙදවුම් භාවිතය

✓ රටේ නිෂ්පාදන කාර්යයට තොරතුරු තාක්ෂණය යොදා ගැනීම

✓ අන්තර්ජාලය ඔස්සේ තොරතුරු ගවේෂණය කිරීම තුළින් ලෝකයේ විවිධ තොරතුරු පිළිබඳ දැන ගැනීමේ අවස්ථාව

✓ නව දැනුම සොයා යෑමට අවස්ථාව ලැබීම

✓ ලෝකයේ නව වෙළඳ ප්‍රවණතා, ආර්ථික සංවර්ධන ක්‍රියාවලි පිළිබඳ අධ්‍යයනය හා භාවිතය

✓ නව පර්යේෂණ සඳහා රුකුලක් වීම

✓ වළාකුළු පරිගණනය මඟින් වඩා හොඳ යෙදුම්, සේවාවන්, ආරක්ෂාව, විශ්වාසනීයත්වය සහ තොරතුරු ලැබා ගැනීමේ හැකියාව

- ✓ අනිසි ලෙස භාවිතය නිසා සෞඛ්‍ය ගැටළු, සදාචාරාත්මක ගැටළු, නෛතිකමය ගැටළුවල වර්ධනයක් පෙන්නුම් කර ඇත.
- ✓ අංකිත බෙදීම

ii.
- ✓ ව්‍යාපාර හා කර්මාන්ත ක්ෂේත්‍රය සඳහා තොරතුරු තාක්ෂණික මෙවලම් භාවිතය
- ✓ පරිගණක හා රොබෝ යන්ත්‍ර භාවිතයෙන් නිෂ්පාදන ක්‍රියාවලි සිදු කිරීම
- ✓ අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ බහුලව තොරතුරු තාක්ෂණික මෙවලම් භාවිතය
- ✓ මාර්ගගත හා දූරස්ථ අධ්‍යාපන ක්‍රමවේද පුළුල් වී තිබීම
- ✓ ඊ-රාජ්‍ය සේවාවන් ඔස්සේ වඩාත් හොඳ රාජ්‍ය සේවාවක් ලබා දීමට හැකි වීම
- ✓ කෘෂිකාර්මික යෙදවුම් බහුලව යොදා ගෙන තිබීම
- ✓ සංචාරක කර්මාන්තය වැඩි දියුණු කර ගැනීමට පරිගණක හා යෙදවුම් බහුලව භාවිතා කර තිබීම
- ✓ ප්‍රවාහන ක්ෂේත්‍රයේ යෙදවුම් නිසා වඩාත් හොඳ හා විශ්වාසනීය ප්‍රවාහන සේවයක් සපයා දීමට හැකි වීම

i.
- ✓ කාපලදෝනා සහලක්ෂණය
- ✓ පුනර්වර්තී ආතති පීඩාව
- ✓ පරිගණක දෘෂ්ටි සහලක්ෂණය
- ✓ මානසික ආතතිය
- ✓ බෙල්ලේ සහ පිටකොන්දේ ආබාධ
- ✓ හිසේ කැක්කුම
- ✓ ඊ-අපද්‍රව්‍ය නිසා ඇති වන චර්ම රෝග, ස්නායු ආබාධ, හෘද රෝග සහ ශ්වසන රෝග ආදිය බහුල වීම

ii.
- ✓ පරිගණකය භාවිතයේ නිවැරදි ඉරියව් භාවිතය
- ✓ එක දිගට පරිගණකය දෙස දිගු වේලාවක් බලා සිටීමෙන් වැළකීම හා වරින් වර විවේක ගැනීම
- ✓ පරිගණක උපාංග සහ ආසන නිසි ලෙස ස්ථානගත කර භාවිතයට ගැනීම
- ✓ විද්‍යුත් අපද්‍රව්‍ය නිවැරදිව කළමනාකරණය කිරීම හා අනිසි අන්දමින් පරිසරය බැහැර නොකිරීම
- ✓ පරිගණක භාවිතයේ දී ගැනෙන ශ්‍රව්‍ය හා දෘෂ්‍ය උපකරණ භාවිතය හා සුදුසු පරිදි භාවිතය

iii.
- ✓ 3R සංකල්පය ක්‍රියාවට නැංවීම
- ✓ කාර්යක්ෂම හා පරිසර හිතකාමී පරිගණක සම්පත් අධ්‍යයනය හා භාවිතය
- ✓ ප්‍රජාව දැනුවත් කිරීම
- ✓ පරිසර හිතකාමී භාවිත හා භාවිත කරන්නන් ප්‍රවර්ධනයට කටයුතු කිරීම
- ✓ විදෙස් රටවලින් මෙරටට ගෙන්වන ප්‍රයෝජනවත් කාලය ඉක්මවූ ඉලෙක්ට්‍රොනික උපකරණ ගෙන්වීම සීමා කිරීම හෝ සම්පූර්ණයෙන් නැවතීම
- ✓ භාවිතය අඩු කිරීම හා බහු කාර්ය උපාංග භාවිතයට හුරු කිරීම

(5)

i. ආදානය - ඇඟිලි සලකුණ ක්‍රියාවලිය - ඇඟිලි සලකුණ නිවැරදි දැයි පරීක්ෂා කිරීම

ප්‍රතිදානය - පැමිණි හා පිටවූ වේලාවන් ඇතුළත් මෘදු පිටපත

ii. වාසි - වෙහෙස නොවීම, පැය 24ම සේවය, නිවැරදිතාවය

අවාසි - මිනිස් ශ්‍රමය අඩුවෙන් වැය වීම නිසා රැකී රක්ෂා ප්‍රමාණය අඩු වීම, මානුෂීය නොවීම

iii. අංකිත පරිගණක

විවික්ත ආකෘතියක තොරතුරු සැකසීමෙන් ගැටළු විසඳීමට හැකි උපාංග වර්ගයකි. ද්විමය තත්ත්ව (0,1) පදනම් කොට ගෙන අංකිත සංඥා මගින් ක්‍රියා කරන පරිගණක වේ.

ප්‍රතිසම පරිගණක -

ප්‍රතිසම දත්ත සැකසීමට භාවිතා කරන පරිගණක වේ. විද්‍යුත්, යාන්ත්‍රික නොහොත් ද්‍රව ප්‍රමාණ වැනි අඛණ්ඩ අගයන් පදනම් කර ගත් දත්ත භාවිතා වේ.

iv.

- සුපිරි පරිගණක

වේගවත් සහ වඩාත් ම බලවත් පරිගණක වර්ගය සුපිරි පරිගණක වේ. මේවායේ ගණනය කිරීම් සුවිශේෂී වන අතර ඉතාම මිල අධිකයි. යුධමය කටයුතු, කාළගුණ අනාවැකි, අභ්‍යවකාශ තොරතුරු ගවේෂණය, සාගර හා භූගර්භ පිළිබඳ තොරතුරු ගවේෂණය වැනි කටයුතු සඳහා යොදා ගැනේ.

- ක්ෂුද්‍ර පරිගණක

ක්ෂුද්‍ර සකසන සහිත කුඩා පරිගණක වේ. එහා මෙහා ගෙන යා හැක. පුද්ගලික ව හෝ පොදුවේ භාවිතා කළ හැකි අඩු ධාරිතාවයෙන් සහිත මතක මෙන්ම වේගය සහ මිල අඩුය. විදුලි පරිභෝජනය අඩුයි. අඩු ඉඩ ප්‍රමාණයක ගබඩා කළ හැකිය. සීමිත කාර්යයනසඳහා යොදා ගත හැකියි. සාමාන්‍ය ජනතාව අතර වඩාත් ජනප්‍රිය පරිගණක විශේෂයයි.

v. ක්‍රියාකාරකම් පාදක අධ්‍යාපනයක් ලැබීම නිසා ඉගෙනුම් ඉගැන්වීම් කටයුතුවල ගුණාත්මක බව ඉහළ නැංවීම

කණ්ඩායම් ක්‍රියාකාරකම් ශක්තිමත් කළ හැකි වීම

ඉගැන්වීමට අපහසු ප්‍රායෝගික කරුණු සිසුන්ට ප්‍රදර්ශනය කිරීමට හැකි වීම

සිසු ක්‍රියාකරකම් සෘජුවම ගුරුවරයාට අධීක්ෂණය කළ හැකි වීම

පැවරුම් උඩුගත කර සිසුන්ට ඒවා සම්පූර්ණ කිරීමට සැලැස්වීම හා එසැණින් අධීක්ෂණය

නිදහස් ඉගෙනුම් රටාව සහ සෑම දරුවෙකුටම එක හා සමාන ක්‍රියාකාරී අධ්‍යාපනයක් ලබා දීමට හැකි වීම

ඒකාකාරී අධ්‍යාපන රටාවෙන් බැහැර වීමට හැකි වීම